## පළාත් පාලන දේශපාලනයේ ප්‍රශ්න, මැතිවරණ ක්‍රමයේ සූත්‍ර සමීකරණ එහාට මෙහාට කිරීමෙන් නොව, පුළුල් නීතිමය වෙනස්කම් රාමුවක් හරහා සිදු විය යුතුය.

පළාත් පාලන නියෝජනයේ අරමුණ ගමේ නගරයේ ප්‍රශ්න විසදීමට ගමෙන් නගරයෙන් නායකත්වයක් ලබා දීමයි. සාර්ථක පළාත් පාලන මැතිවරණ ක්‍රමයක් තුලින් ගමට නගරයට වැඩ කළ හැකි අවංක දක්ෂ අයට ඉදිරියට ඒමට අවස්ථාව ලැබිය යුතුය. 2018 වසරේ පළමුවරට ක්‍රියාත්මකවූ මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමය ලංකාවේත් වෙනත් රටවලත් යොදාගෙන ඇත්තේ සමානුපාතික නියෝජනය ක්‍රමය තුළ ලොකු වපසරියක මනාප ඡන්ද එකතු කිරීම වෙනුවට කුඩා කොට්ඨාස වලින් තරඟ කර තේරී පත්වීමේ අවස්ථාව අපේක්ෂකයින්ගෙන් යම් ප්‍රතිශතයකට ලබා දීමටය. එය තුලින් ඡන්ද දායකයින්ට වඩා සමීපව හා වඩා වග කියන සභිකයින් පත් කර ගැනීම බලාපොරොත්තු වේ.

මෙම කුඩා කොට්ඨාස සහිත සමානුපාත ක්‍රමය නිසා 2018 දී ඡන්ද දායකයින් විසින් පක්ෂ බේදය නොතකා දක්ෂ අවංක පුද්ගලයින් පත් කර ගැනීමේ යම් ප්‍රවනතාවයක් තිබුණි. ඒ නිසාම දේශපාලන පක්ෂ විසින් ඉදිරි මැතිවරණයකදී වඩා සුදුසු පුද්ගලයින් අපේක්ෂකයින් ලෙස තෝරාගැනීම සැබෑවක් විය හැක.

සියයට විසිපහක කාන්තා කෝටාව සාක්ෂාත් කර ගැනීමේදී දිනන පක්ෂයේ දායකත්වය අඩුවී අනු ශූර පක්ෂ වලට වැඩි බරක් පැටවීම හා එම කෝටාව පූර්ණ කර ගැනීමේ ප්‍රශ්න ඇති වීම සිදු වුවත් එම කෝටාව හොඳ ආරම්භයකි.

ඊට අමතරව, සභාවේ මුළු ආසන ගණන සමානුපාතයට බෙදීම තව දුරටත් පවත්වා ගැනීම නිසා කුඩා කණ්ඩායම් වලටද නිසි තැන අහිමි නොවේ. ඇත්තෙන්ම දූෂණයට වංචාවට එරෙහිව රටේ ජන මතයක් ඇතිවී ඇති තත්වයක් යටතේ අලුත් දේශපාලන මතවාදයන්ට අලුත් පුද්ගලයින්ට ඉඩ ලබා දෙන මෙවැනි මැතිවරණ ක්‍රමයක් වෙනස් කිරීම ගැන මැතිවරණ සංශෝධන සඳහා වූ පාර්ලිමේන්තු කාරක සභාව විසින් දෙවරක් සිතිය යුතුය.

2018 මිශ්‍ර මන්ත්‍රී ක්‍රමයේ ප්‍රධාන දුර්වලතාව එල්ලෙන ආසන සංසිද්ධියයි. දෙවැන්න එකදු පක්ෂයකටවත් සභාවල බහුතරයක් නොලැබෙන නිසා සභාවල අස්ථාවර බව ඇතිවන්නේ මිශ්‍ර මන්ත්‍රී ක්‍රමය නිසා යන මතයයි. පළමුවැන්න ඇත්තෙන්ම මිශ්‍ර ක්‍රමන්ත්‍රී සමානුපාත ක්‍රමයට ආවේනික දුර්වලතාවයකි. නමුත් එහි බරපතලකම ගැන අධි තක්සේරුවක් කර ඇති බව ආපේ නිගමනයයි. අස්ථාවරත්වය යන කරුණ පිළිබඳවද ප්‍රචලිත විග්‍රහයද සම්පූර්ණයෙන් සත්‍ය නොවේ. ඒ ගැන පසුව වඩා විස්තරාත්මකව සාකච්ඡා කරමු.

ඉහත ප්‍රශ්න දෙක විසදීම සඳහා කාරක සභාවේ සම්මුතිය ලෙස එම තාක්ෂණික කමිටුවේ සභාපති විසින් මිශ්‍ර මන්ත්‍රී ක්‍රමයේ සමානුපාතික ප්‍රතිඵලය විකෘති කිරීම ඉලක්ක කර ගත් යෝජනා දෙකක් විශ්ලේෂණයකින් තොරව ඉදිරිපත් කර ඇත.

එම යෝජනා නම් (1) යම් පක්ෂයකට එල්ලෙන ආසන ලබා දිය යුතු අවස්ථාවේදී ඒ සඳහා අලුතෙන් ආසන පැනවීම වෙනුවට ඒවා අනෙකුත් පක්ෂවලින් හිලවු කර ගැනීම හා (2) වැඩිම ආසන ගත් පක්ෂයට ප්‍රසාද ආසන ප්‍රදානය කිරීම (සභිකයන් 20ට අඩු පළාත් පාලන ආයතන සඳහා එක් ප්‍රසාද දීමනාවක් සහ සාමාජිකයින් 20ක් හෝ වැඩි ගණනක් සිටින අය සඳහා 2ක්).

එම යෝජනා හා ඒවාට ප්‍රස්තූත වන ප්‍රශ්න තව දුරටත් සාකච්ඡා කරමින් මිශ්‍ර මන්ත්‍රී ක්‍රමය පිළිබඳව යථා අවබෝධයක් ලබා ගැනීමට මෙය අවස්තාවක් කර ගනිමු.

### 1. පළාත් පාලන සභා සඳහා ස්ථාවරත්වයක් අවශ්‍යය යන මතය

සමනුපාත ක්‍රමයෙන් පත්වන සභාවල කිසිම පක්ෂයට බහුතරයක් නොලැබී ඒවායේ අස්ථාවර තත්වයක් ඇති වීම සමානුපාත ක්‍රමය පළමුව පළාත් පාලනයට හඳුන්වා දීමේ සිටම පැවතෙන ප්‍රශ්නයකි. ඒ නිසාම පත්වන සභාපතිවරුන් හේතුවක් නොමැතිව අයවැය විවාද වලදී පරාජය කිරීම වැළැක්වීම සඳහා නීතිමය ප්‍රතිපාදන අදාළ පනත් වලට ඇතුලත් කර ඇත. (උදාහරණ ලෙස අදටත් යම් සංශෝධන සහිතව වලංගු වන ප්‍රාදේශීය සභා පනතේ 167 වන වගන්තිය).

ඊට අමතරව පළාත් පාලන සභා වල ස්ථාවරත්වය සඳහා තාක්ෂණික කමිටුව විසින් යෝජිත මෙවලම් දෙක කොතෙක් දුරට සාර්ථකද විමසා බලමු.

## 1.1.බෝනස් ආසන ලබා දීමේ විසඳුම

මැතිවරණ ක්‍රම වලදී වැඩිම ඡන්ද ලබා ගන්නා පක්ෂයට බෝනස් ආසන පිරි නැමීම ලංකාවේ පාර්ලිමේන්තු සහ පළාත් සභා මැතිවරණ වලදී මෙන්ම වෙනත් සීමිත රටවල් කිහිපයක මැතිවරණ ක්‍රම වලදී අනුගමනය කරන ක්‍රමවේදයකි.

2018 අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ප්‍රාදේශීය සභාවේ හා කොළඹ දිස්ත්‍රික්කයේ කෝට්ටේ-ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභවේ 2018 ඡන්ද ප්‍රතිපලවලට දැනට යෝජිත ලෙස බෝනස් ආසන ලබාදීම යොදා බලමු. 2018 මැතිවරණයේදී එම සභාවේ එල්ලෙන ආසන සංසිද්ධියක් නොතිබිණි.

වගු එනක එකේ දක්වා ඇති ගණනයන් අනුව හොරොවුපතාන සභාවේ වැඩි ඡන්ද ගණනක් ලබා ගත් පක්ෂයය වන පොදු ජන පෙරමුණට බෝනස් ආසන දෙකක් දීමෙන් ඔවුන්ගේ ආසන ප්‍රතිශතය වැඩි වන්නේ 40% සිට 45% දක්වා පමණය

වගු අංක 1: හොරොවුපතාන ප්‍රාදේශීය සභාව (යෝජනාව: එල්ලෙන ආසන නැත. බෝනස් ආසන දෙකක් ලැබේ.)

| Party | Votes | Percent Votes | PR Seats | FPP Seats | # Seats Current | # Seats Proposed | % Seats Current | %Seats Proposed | PR-18 |
|---|---|---|---|---|---|---|---|---|---|
| UNP | 8,148 | 34% | 7 | 2 | 7 | 6 | 35% | 30% | 6.19 |
| JVP | 687 | 3% | - | - | - | 1 | 0% | 5% | 0.52 |
| SLFP | 4,528 | 19% | 4 | 2 | 4 | 3 | 20% | 15% | 3.44 |
| SLPP | 9,175 | 39% | 8 | 8 | 8 | 9 | **40%** | **45%** | 6.98 |
| IND | 1,137 | 5% | 1 | - | 1 | 1 | 5% | 5% | 0.86 |
| | 23,675 | 100% | 20 | 12 | 20 | 20 | 100% | 100% | 18 |

## 1.2.එල්ලෙන ආසන අනු ශූරයන්ගෙන් හිලවු කර ගැනීම

2018 පළාත් පාලන මැතිවරණයේදී පළාත් පාලන ආයතන 333 කින් 202 ක එල්ලෙන ආසන 376ක් පැවතුනි. මෙයින් 65% ක්ම SLPP සතු ආසන විය. මෙම එල්ලෙන ආසන සඳහා අමතර අසුන් පනවන්නේ නැතිව ඒවා අනු ශූර පක්ෂ වල ආසන වලින් හිලවු කර ගැනීමෙන් ලැබෙන ප්‍රතිඵලය විසඳමු.

කෝට්ටේ මහා නගර සභාවේ වැඩිම ඡන්ද ප්‍රතිශතය ලෙස 41.4% ක් ලබාගත් පොදු ජන පෙරමුණට මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමය තුලින් සභාවේ ආසන වලින් 47.4% ක් හිමි විය. එම පක්ෂයට බෝනස් දෙකක් ලබා දුන්නොත් එම ප්‍රතිශතය 51.4% දක්වා වැඩිවේ (වගු අංක 2).

**වගු අංක 2. කෝට්ටේ-ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාව (යෝජනාව: එල්ලෙන ආසන තුන අනු ශූරයන්ගෙන් හිලවු කර ගැනීම ).**

| Party | Votes | Percent Votes | PR Seats | FPP Seats | # Seats Current | #Seats New | % Seats Current | %Seats New | PR-17 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ONP | 35 | 0% | | | | - | - | - | 0.02 |
| UPFA | 7,676 | 14% | 5 | - | 5 | 4 | 13.2% | 11.4% | 4.18 |
| UNFP | 522 | 1% | 0 | - | 0 | - | - | - | 0.28 |
| UNP | 18,000 | 34% | 12 | 3 | 12 | 10 | 31.6% | 28.6% | 9.80 |
| JVP | 4,885 | 9% | 3 | - | 3 | 3 | 7.9% | 8.6% | 2.66 |
| SLPP | 22,068 | 41% | 15 | 18 | 18 | 18 | **47.4%** | **51.4%** | - |
| IT | 113 | 0% | - | - | - | - | - | - | 0.06 |
| Total, All | 53,299 | 1 | 35 | 21 | 38 | 35 | 100% | 100% | 17 |

එල්ලෙන ආසන වලට විසඳුම හා බෝනස් ආසන යන මෙවලම් දෙකම එක වර යෙදුවොත් ඇත්තටම එල්ලෙන ආසන වලට විසඳුමෙන් ලැබෙන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයක් දිනන පක්ෂයට හිමි නොවේ (වගු අංක 3). ඇත්තෙන්ම මෙවලම් දෙකම යෙදීමෙන් 2018 දින පක්ෂට හිමිවන් ආසන ප්‍රතිශතය වන 49% එල්ලෙන ආසන සඳහා මෙවලම පමණක් යෙදීමෙන් ලැබෙන ප්‍රතිශතය වන 51.4 ටම සමානය. මෙයට හේතුව දිනන පක්ෂයට


බෝනස් එකෙන් ලැබෙන වාසිය එල්ලෙන ආසන වලින් ලැබෙන වාසිය ඇතුලේ ලැබීම නිසා බෝනස් වාසිය නිශේධ වීමයි.

වගු අංක 3. කෝට්ටේ-ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාව (යෝජනාව : එල්ලෙන ආසන තුන අනු ශූර පක්ෂ වලින් හිලවු කර ගැනේ. බෝනස් ආසන දෙකක් ලැබේ.)

| Party | Votes | Percent Votes | PR Seats | FPP Seats | # Seats Current | #Seats New | % Seats Current | %Seats New | PR-33 | PR-17 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ONP | 35 | 0.1% | - | - | - | - | - | - | 0.02 | 0.019 |
| UPFA | 7,676 | 14.4% | 5 | - | 5 | 4 | 13% | 13.5% | 4.75 | 4.178 |
| UNFP | 522 | 1.0% | - | - | - | - | - | - | 0.32 | 0.284 |
| UNP | 18,000 | 33.8% | 12 | 3 | 12 | 10 | 30% | 30% | 11.14 | 9.798 |
| JVP | 4,885 | 9.2% | 3 | 0 | 3 | 3 | 7.9% | 8.1% | 3.02 | 2.659 |
| SLPP | 22,068 | 41.4% | 15 | 18 | 18 | 18 | 47% | 51.4% | 13.66 | |
| IT | 113 | 0.2% | - | - | - | - | - | - | 0.07 | 0.062 |
| Total, All | 53,299 | 100% | 35 | 21 | 38 | 35 | 100% | 100% | 33 | 17 |

## 1.3.යෝජනා දෙකෙන්ම "බහුතරයක් නොමැති" ප්‍රශ්නයට සාධනීය විසඳුමක් නොලැබේ

2018 පළාත් පාලන ආයතන 333 න් 103 ක දිනන පක්ෂය 50% වැඩි ඡන්ද ප්‍රතිශතය ලබා ගන්නා විට, 148 ක් 40-50% අතරත්, තවත් 136 ක් 40% ට අඩුවෙන් ඡන්ද ලබා සිටියහ. යෝජිත වෙනස් කම් දෙක තුලින් බොහෝ දුරට වාසි ලබා ගත හැක්කේ 40-50% අතර ඡන්ද ලබා ගත් පක්ෂ වලටයි.




ඒ නිසා පළමුව, මේ ක්‍රමයෙන් දිනන පක්ෂය 40% ට අඩු ඡන්ද ප්‍රතිශතයක් ලබන සභා 136 කට විසඳුමක් නැත.

දෙවනුව, දිනන පක්ෂ වලට 50% කට වඩා ඡන්ද ගැනීමට බැරි වූයේ මැතිවරණ ක්‍රමය නිසා නොව දේශපාලන යථාර්තය නිසාය.

උදාහරණ ලෙස, 2018 මැතිවරණයේදී සමස්තයක් ලෙස ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ (SLPP) 46.65% ක් ඡන්ද ලබා ගන්නා විට එක්සත් ජනතා නිදහස් සන්ධානය (UPFA) හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පිළිවෙලින් ඡන්ද 8.94% ක් 4.44% ලබා ගන්නා ලදී. එම පක්ෂ/සන්ධාන තුන ලැබූ ඡන්ද එකතු කල විට 58.03% ඡන්ද ප්‍රතිශතයක් ඇත. ඇත්තෙන්ම මේ කණ්ඩායම් තුනම මීට පෙර UPFA ලෙස සන්ධාන ගතව තරඟ කල අයවලුන්ගෙන් සමන්විත නිසා, පොදුජන පෙරමුණට බහුතරයක් ලබා ගැනීමට නොහැකි වීමට හේතුව සමාන දේශපාලන මතවාදයක් තුන් අතකට බෙදීම මිස මැතිවරණ ක්‍රමය නොවන බව පෙනේ. ඉදිරියේදී පක්ෂ කෙසේ කැඩේ කෙසේ එක්වේද කියා නොහැක.

විශේෂයෙන්ම පළාත් පාලනයේදී, පාර්ලිමේන්තුවේ මෙන් නොව, පක්ෂ දේශපාලනය අභිබවා පුද්ගලවාදය ඉස්මතුවීමට අවකාශ වැඩිය. ඇත්තෙන්ම තම පක්ෂයෙන් පත්වන සභාපතිවරයා ඉවත් කර බලය ලබා ගැනීමට එළිපිටම එම පක්ෂයේ අයම උත්සාහ කරන අවස්ථා වාර්තා වේ.

සමස්තයක් ලෙස දේශපාලන ප්‍රශ්න වලට සූත්‍ර සමීකරණ එහා මෙහාට කිරීමෙන් විසඳුම් සෙවීම නිෂ්ඵල ක්‍රියාවකි.


පළාත් පාලන සභා වල ස්ථාවර බව වැදගත් නම් සමානුපාත නමට මුවාවී අවසාන ප්‍රතිඵලය කේවල ප්‍රතිඵලයකට ආසන්න කිරීම තුලින් ස්ථාවරත්වය සාක්ෂාත් කර ගැනීමේ උත්සාහය කිසි සේත් අනුමත කළ නොහැක. පළමුව පළාත් පාලනයට පූර්ණ කේවල ක්‍රමයක් හෝ කේවල ක්‍රමයට වඩා ආසන්න ප්‍රතිඵලයක් ලබා දෙන මිශ්‍ර මන්ත්‍රී බහුතර ක්‍රමයක් වඩා සුදුසුද යන්න ගැන මැතිවරණ සංශෝධන කාරක සභාව විසින් සාකච්ඡාවක් පවත්වා ඒ ගැන යම් තීරණයකට එළඹිය යුතුය. සමානුපාත ක්‍රමය පවත්වා ගැනීම වැදගත් වෙනස් කම් කළ යුත්තේ සමානුපාත ක්රාමයේ විකෘත කිරීම අවම කර ගනිමිනි.

## 2. සභික සංඛ්‍යාව වැඩිය යන මතය

2018 මැතිවරණයෙන් පත් වුනු සභික සංඛ්‍යාව පෙර තිබූ ගණනට වඩා දෙගුණයක් වීම ගැන සමාජයේ අප්‍රසාදයක් ඇතිවීම සාධාරණය. නමුත් එම ගණන අඩු කිරීමට තාක්ෂණික කමිටුව විසින් ඉදිරපත් කර ඇති යෝජනා හානිකර හෝ ඵලදායී නොවන ඒවා වේ.

## 2.1. මිශ්‍ර මන්ත්‍රී අනුපාතය 70:30 ටවෙනස් කිරීම

තාක්ෂණික කමිටුව විසින් තිබෙන කොට්ඨාස සභික ගණන 5092 පවත්වා ගනිමින් කේවල:ඌන පූරණ ආසන අනුපාතය 70:30 වෙනස් කිරීම තුලින් සභික ධූර ගණන 1080 කින් අඩු කිරීමට යෝජනා කර, දෙවනුව එම යෝජනාව ඉල්ලා අස් කරගෙන ඇත. ඇත්තෙන්ම සුළු ගණනකින් සභික ධූර ගණන අඩු කිරීමට මැතිවරණ ක්‍රමය 70:30 වෙනස් කිරීම වැනි තීරණාත්මක වෙනසක් කිරීම ප්‍රඥාවන්ත නොවේ. අනුපාතය 70:30 වෙනස් කිරීම නිසා එල්ලෙන ආසන ප්‍රශ්නය තවත් තීව්‍ර වේ. උදාහරණ ලෙස අනුපාතය 70:30 ට වෙනස් කිරීමෙන් කෝට්ටේ මහා නගර සභාවේ සභික ගණන 35 සිට 30 ට අඩු කළ හැකි වුවත් , එවිට එල්ලෙන ආසන ගණන 5 කට වැඩි වීම නිසා මුළු ආසන ගණන නැවත 35ට නගී.




## 2.2. එල්ලෙන ආසන අනු ශූරයන්ගෙන් හිලවු කර ගැනීම

තාක්ෂණික කමිටුව ලබා දී ඇති දත්ත වලට අනුව, 2018 පළාත් පාලන මැතිවරණයේ දී සභා 333 කින් 202 කටම එල්ලෙන ආසන 376ක් ලෙස එම එල්ලෙන ආසන සංසිද්ධිය අත් දැකීමට සිදු වුනි. මෙම ආසන වලින් 281 ක් ම ලැබුනේ පොදු ජන පෙරමුණටය.

කෝට්ටේ මහා නගර සභා උදාහරණය ගත් විට එහිදී පොදුජන පෙරමුණ පක්ෂය විසින් ලබා ගත් ඡන්ද ප්‍රතිශතය අනුව හිමි ආසන ගණන මුළු ආසන තිස් පහෙන් පහළොවක් පමණක් වුවත් එම පක්ෂය විසින් කොට්ඨාස මට්ටමෙන් කේවල ක්‍රමයට කොට්ඨාස ආසන විසි එකෙන් දහ අටක්ම දිනා ගන්න ලදී. එම පක්ෂයට අමතරව අනිවාර්යෙන් ලබා දිය යුතු මෙම ආසන තුනේ වෙනස එල්ලෙන ආසන ලෙස හැදින්වේ.

එල්ලෙන ආසන වලට අමතර ආසන ලබා දෙන්නේ නැතිව ඒවා අනු ශූර පක්ෂ වලින් හිලවු කර ගැනීම තුලින් 2018 ප්‍රතිඵල වලින් අඩු කරගත් හැකි උපරිම මන්ත්‍රී සංඛ්‍යාව 376 කි.

## 3. සාරාංශය හා විකල්ප යෝජනා

සමස්තයක් ලෙස, ස්ථාවර බව ඇති කිරීමට ඉදිරිපත් කර ඇති බෝනස් ආසන දීම හා එල්ලෙන ආසන අනු ශූර පක්ෂයෙන් හිලවු කර ගැනීමේ යෝජනා බලපාන්නේ දිනන පක්ෂය විසින් 40-50% ත් අතර ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත් සභා 148 ක් හෝ 44% කට පමණි. සියයට හතලිහට අඩුවෙන් ඡන්ද ලබා ගත් සභා 103 කට හෝ 30% කට ඉන් විසඳුමක් නැත. දෙවනුව, අස්ථාවර භාවයට හේතුව දේශපාලන පක්ෂ වල අස්ථාවර භාවය හා ඒ නිසා බොහෝ විට එකම පක්ෂයේ පටු පුද්ගලික බල ලෝභයෙන් ක්‍රියා කිරීමයි. එම යථාර්තයට විසඳුම පළාත් පාලන දේශපාලනයට සුදුසු පුද්ගලියින් පත් කර ගැනීමට වාතාවරණයක් සෑදීම මිස සූත්‍ර සමීකරණ එහාට මෙහාට කිරීම නොවේ.

සභා වල සභික සංඛ්‍යාව අඩු කිරීමට එල්ලෙන ආසන 376 සීමා කිරීමෙන් ඇතිවන බලපෑම අල්පය. මැතිවරණ සමීකරණය 70:30 වෙනස කිරීමෙන් එල්ලෙන ආසන වැඩිවී අනුශූර පක්ෂ වලට ඇති අවකාශය තවත් අඩු කරයි අවසාන වශයෙන් අප විසින් මතක් කර දිය යුත්තේ පලාත් පාලනය පිළිබඳ 1999 කොමිෂන් සභා සභා වාර්තාවේ පස්වැනි ඇමුණුමේ සඳහන් පරිදි 1981 දී එවකට තිබූ මහා නගර, නගර, සුළු නගර හා ගම් සභා 683 අහෝසි කරන විට ඒවායේ කොට්ඨාස 8243 ක් පැවතිනි. 2012 සීමා නිර්ණයේදී කොට්ඨාසයක ප්‍රමාණය තීරණය කිරීමට විද්‍යාත්මක ක්‍රමයක් යොදා ගත් බව නොපෙනේ. එම නිසා සභික සංඛ්‍යාව යන සාධකය සඳහා එකම විසඳුම වන්නේ ළඟ එන මැතිවරණයට නොව අනාගත මැතිවරණ සඳහා කල් යල් බලා විධිමත් සීමා නිර්ණයක් කිරීමයි.

විකල්ප විසඳුම් ලෙස අප විසින් යෝජනා කරන්නේ:

1. මැතිවරණයක් අබියස සමානුපාතික මැතිවරණ ක්‍රමයක් තුල කේවල ක්‍රමයට දිනන පක්ෂයට වැඩි වාසියක් ලබා දීම අරමුණු කරගත් වෙනස්කම් යෝජනා කිරීම සදාචාරාත්මක නොවන බව සලකන්න.
2. සභාවල ස්ථාවරත්වය පිළිබඳ ප්‍රශ්නය සඳහා දැනට ඇති නීතිමය ප්‍රතිපාදන විමර්ශනය කර අවශ්‍ය නම් ඒ පිළිබඳ තව දුරටත් වෙනස් කම් යෝජනා කිරීමට තාක්ෂණික කමිටුවට උපදෙස් දෙන්න.
3. සභාවල සභික ධූර ගණන අඩු කිරීමට ඇති එකම විකල්පය නව සීමා නිර්ණයකින් කොට්ඨාස ගණන අඩු කර ගැනීම යන යථාර්තය කණගාටුවෙන් වුවත් පිළිගන්න.
4. එම නිසා 2018 පළමුවරට ක්‍රියාත්මක වූ මිශ්‍ර මන්ත්‍රී ක්‍රමයට 2022 දී එලෙසම පවත්වන්න.
5. සියයට විසිපහක කාන්තා නියෝජනය තහවුරු කිරීමට කොට්ඨාස අපේක්ෂක ධූර කෝටාව 10% සිට 20%ට වැඩි කිරීමේ සරල හා පාරදෘශ්‍ය යෝජනාව වහාම සම්මත කරන්න. එම ප්‍රතිශතය 30% ට වැඩි කිරීම සලකා බලන්න
6. ඊට අමතරව 2007 මැතිවරණ සංශෝධන පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේ අතුරු වාර්තාවේ ඇමුණුමකින් යෝජනා කළ හා වත්මන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නැවතත් දියුණු කර වත්මන් කාරක සභාවට ඉදිරිපත් කර ඇති මෙන්ම සිවිල් සමාජය විසින් පුන පුනා ඉල්ලා සිටින පහත සඳහන් අවම නීතිමය වෙනස්කම් වහාම නීතිගත කරන්න.
    - මැතිවරණ සඳහා නිශ්චිත දිනයක් නියම කිරීම
    - අපේක්ෂකයින්ගේ අපරාධ චෝදනා, වත්කම් බැරකම් හා ජීව දත්ත ඇතුලත් දිවුරුම් ප්‍රකාශනයක් නාමයෝජනා සමගම ඔන්ලයින් ක්‍රමයට භාර දීමත් සමගම ප්‍රසිද්ධ කිරීම (https://affidavit.eci.gov.in/ බලන්න.)
    - කොට්ඨාස ආසන සඳහා මැතිවරණ පෙත්සම් හා අතුරු මැතිවරණ ප්‍රතිපාදන හඳුන්වා දීම
    - පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම සඳහා ඒවායේ ව්‍යවස්ථාවන්ට නිර්ණායක පැනවීම.
7. මැතිවරණ කොමිසම විසින් මැතිවරණ දත්ත විශ්ලේෂනයට භාජනය කිරීමට හැකිවන ලෙස ජනතාවට ලබා දිය යුතු යයි යෝජනා කරන්න. (මැතිවරණ කොමිසම විසින් පිටස්තරයින් මැතිවරණ දත්ත හැක් කරයි යන දුර්මතයේ පිහිටා මැතිවරණ දත්ත විශ්ලේෂනයට භාජනය කිරීම දුෂ්කර PDF වාර්තා ලෙස පවත්වා ගනී.) මෙහිදීද ඉන්දියාව ආදර්ශයට ගන්න.
8. 2026 දී පළාත් පාලන මැතිවරණ සඳහා ප්‍රශස්ත සභික සංඛ්‍යාවක් නිර්ණය කිරීම, පත්කර ගැනීම හා එසේ පත් කර ගන්නා සභාවල ස්ථාවරත්වය පිළිබඳ දෙස් විදෙස් තොරතුරු අනුසාරයෙන් විද්‍යාත්මක විශ්ලේෂණයක් ලබා දීමට ස්වාධීන පර්යේෂණ ආයතනයක් හෝ කණ්ඩායමක් තරඟකාරී ක්‍රමයකට තෝරා ගන්න.
9. පාර්ලිමේන්තු, පළාත් සභා, හා පළාත් පාලන මැතිවරණ ප්‍රතිසංස්කරණ කඩින් කඩ නොව එකිනෙකට හා එක එක ආණ්ඩු තලයට සරිලන ලෙස එක වරම සිදු කරන්න.
10. ඒ සෑම අවස්ථාවකම තෝරා ගන්නා මැතිවරණ ක්‍රමය යන්න සමානුපාත, මිශ්‍ර මන්ත්‍රී සමානුපාත, මිශ්‍ර මන්ත්‍රී බහුතර, කේවල හෝ වෙනත් ක්‍රමයක් විය යුතුද යන්න ගැන දැනුවත්ව තීරණ ගැනීමට හැකිවන ලෙස ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කරන්න.

ඊට අමතරව මේ සියල්ල සම්පූර්ණ වුවත් දේශපාලන පක්ෂ වල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් නොමැතිනම් හා මැතිවරණ කොමිසමේ ස්වාධීනත්වය තහවුරු කල නොහැකි නම් සාධාරණ හෝ ඵලදායී මැතිවරණ ප්‍රතිඵලයක් බලාපොරොත්තු විය නොහැක. එමන් නිසා මැතිවරණ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සුරැකෙන ලෙස එම කොමිෂන් සභාවේ පත්වීම් වෙනත් ස්වාධීන කොමිෂන් සඳහා පත්වීම් කිරීමට ජනාධිපතිවරයාට අසීමිත බල තල ලබාදුන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්තාවේ විසිවෙන සංශෝධනය වහාම අවලංගු කිරීමට මුළු පාර්ලිමේන්තුවේ අවධානය යොමු විය යුතු බවත් නිර්දේශ කරන්න.